කවරයේ කතාව

# පාරාදීසයට එන්න ඉඩ දෙන්න

ඩයිනසෝරයන් නැති වූ යුගයේ සිට මේ දක්වා කාලය තුළ කිසිදු යුගයක නොවූ විරූ තරම් වේගයකින් පෘථිවියේ ජීවීහු වඳවීමේ වේගය වැඩි වී ඇත.

**උදෑසන තුනී මීහිදුම් පටලයක් වනහිස මුදුනේ පැතිරී තිබෙයි. පීටර් ටැගාර්ට් කෑඳැත්තෙක් ගසක අත්තක් මත තැබුවේ ය. නිරිතදිග කාම්බෝජියාවේ කාඩමම් කඳුවැටියේ 'අනවසර දඩයම්' පාලන ස්ථානයක් පවත්වා ගෙන යන්නෙක් වූ පීටර් මැගාර්ඩ් පැවසු පරිදි මෙම කෑඳැත්තා ගම් වැසියකු ළඟ තිබී රාජ සන්තක කළ එකෙකි.**


**සුදු පැහැ පපු පෙදෙසක් හා කහ පැහැ ඉතා විශාල හොටක් සහිත කාල වර්ණ වූ මෙම පක්ෂියා සුරතලයට ඇති කර ඇත්තේ වොෂින්ටනය පදනම් කර ගත් ජාත්‍යන්තර සංරක්ෂණායතනයක සේවය කරන්නකු බවත්, කෑඳැත්තා යනු රක්ෂිත පක්ෂියෙක් බව තමා නොදන්නේ යයි ඔහු පැවසුවත් ඇත්ත වශයෙන් ම සියලු දෙනා ම එය හොඳින් දන්නා බව මැගාර්ඩ් පවසයි.**

මේ දිනවල වන ජීවින් හා වනාන්තර සංරක්ෂණය කාම්බෝජියාවේ නිරන්තර කතාබහට ලක් වී ඇත. හෙක්ටයාර මිලියනයක් පමණ වූ වැසි වනාන්තර හා එහි ජීවත් වූ සත්තු කාම්බෝජියානු යුද්ධය නිසා වසර ගණනාවක් පුරා අමතකව ගොස් සිටියහ. මෙම සතුන් අතර කොටින් දිවියන් බුරන මුවන් හා ගිබන් ආදි නොයෙක් වර්ගයේ සත්තු වූහ. කාඩමම් කඳුවැටිය කමරූ ගරිල්ලන් විසින් සැඟවී සිටීමේ ස්ථානයක් ලෙස ප්‍රයෝජනයට ගත් අතර මිනිසුන් එම ප්‍රදේශයට ඇතුල් වීම වැළැක්වීම සඳහා පතල් කැනීම් හා උගුල් අටවා තැබීම් ආදිය සිදු කරල ලදී. එහෙත් 1990 වසර වලදී යුද්ධය අවසන් වීමත් සමගම ගොවීන් දඩයක්කරුවන් හා දැව කපන්නන් මෙම වනයට ඇතුළු වීම ආරම්භ විය. ඒ සමගම අග්නිදිග ආසියාවේ දැනට ඉතිරිව තිබෙන අවසන් වන ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම සඳහා නව උපාය මාර්ග සකස් කර ගැනීමට පරිසර හිතකාමීන්ට සිදු වී තිබේ.


එක්සත් ජාතීන්ගේ වන පතනෙහි දක්වන ආකාරයට "මිනිසා වනයට අමුත්තකු මිස වනයේ රැඳී සිටින්නකු නොවිය යුතු ය" ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සම්බන්ධව වනාන්තර ඉතා සුවිශේෂී මෙහෙයක් ඉටු කරයි. පෘථිවියේ භූමි ප්‍රමාණයෙන් 6% ක් පමණ වසා පවතින ඝර්ම කලාපීය වැසි වනාන්තර පමණක් ගත් විට ඒවා දැනට හඳුනාගෙන සිටින සත්තව වර්ග වලින් අඩකටත් වැඩි ප්‍රමාණයකට නිවහන් සපයා ඇත. එහෙත් මිනිස් ආක්‍රමණ නිසා බිඳ වැටී ඇති පරිසර රටාවන් නිසා සත්ත්ව වර්ග වඳවී යාමේ වේගය ඩයිනසෝරයන් වඳවූ යුගයේ සිට මේ දක්වා කාලය තුළ කිසිදු යුගයක දක්නට නොවූ විරූ තරම් වේගයකි. හාවර්ඩ් විශ්විද්‍යාලයේ ජීව විද්‍යාඥයකු වන එඩ්වර් ඕ විල්සන් මහතා 'වයර්ඩ්' සඟරාවේ නිර්මාතෘ වන කෙවින් කෙලී හා ස්ටුවර්ට් බ්‍රෑන්ඩ් නම් 'විශ්ව ලේඛනය' සකස් කළ දෙදෙනා සමග වසර 25 සඳහා ඩොලර් බිලියන 5 ක උත්සාහයක් දරා පෘථිවිය මත වෙසෙන සියලු සත්ත්ව වර්ග ලේඛනගත කිරීමක් සඳහා මුදල් රැස් කරමින් සිටියි. සමහර විට මොවුන්ගෙන් 80% පමණ තව ම සොයා ගෙන නොමැති විය හැකි ය. ඇත්ත වශයෙන් එම ජීවයේ අතිශය වටිනාකමක් පවතින අතර අපගේ අනුග්‍රහය ඔවුන්ගේ එක ම බලාපොරොත්තුව බව 'ජීවයේ අනාගතය' ට ලියමින් විල්සන් පවසයි. ස්වභාවික වාසස්ථාන මනුෂ්‍ය වර්ගයාට අමිල සේවයක් සපයයි. එය කාලගුණ තත්ත්වයන් පාලනය කිරීමේ සිට ජලය පිරිසිදු කිරීම දක්වා ද ඉන් අමතරව ඖෂධ



**කාම්බෝජියාවේ කාඩමම් කඳුවැටිය අසබඩ මෙම ගිබන් සතා වැනි සතුන් විකිණීම කෙරේ.**



පාරාදීසය හවායි දූපතේ දකුණුපස පිහිටි පැල්මයිරා දූව නොකිලිටි ලෙස තබා ගැනීම සඳහා නේචර් කොන්සවේන්සි ආයතනය විසින් මිලයට ගන්නා ලදී.



කොරල් සාඩම්බරය මෙම දිගු නාසයක් සහිත උකුසු මාළුවාට නිවහන වූ ඕස්ට්‍රේලියාවේ මහා බාධක පරය ලෝක සම්පතක් ලෙස ආරක්ෂා කර ඇත.

වර්ග සැපයීම දක්වා ද මිනිසාට උදව් වේ. එසේම අනාගත පරම්පරාවට පැන්ඩාවෙක් හෝ මොල්ලිය සහිත තල්මසෙක් දක්නට අවස්ථාවක් නොමැති වුවහොත් ඇති වන තත්ත්වය කෙබඳු විය හැකි ද?

එහෙත් සියල්ල නැති වී නොමැත. අවම වශයෙන් තව ම එසේ සිදුවී නොමැත. විල්සන් හා අනෙකුත් පිරිස් සිදුවිය හැකි ගැටුමක් පිළිබඳව අනතුරු ඇඟවීමත් සමගම පරිසර සංරක්ෂණ කණ්ඩායම් විද්‍යාඥයන් වැසි වනාන්තරවල පවතින තණ බිම් ද තුන්ද්‍රා ප්‍රදේශ හා කොරල් පර ආදිය විශ්ව ගම්මානය විසින් ගිලගනු ලැබීමට ප්‍රථම රැක ගැනීම සඳහා නව්‍ය වූ උපාය මාර්ග සොයමින් සිටියි. සියලු දෙනාට ම මුහුණ දීමට සිදුවී ඇති මූලික ගැටලුව වන්නේ මිනිසාගේ ආර්ථික අවශ්‍යතා හා ස්වභාවික පරිසරයේ අනාරක්ෂිත බව යි.

විද්‍යා හා සංරක්ෂණ ජාත්‍යන්තර ආයතනයේ ජ්‍යෙෂ්ඨ උප සභාපති ගස්ටාවෝ ෆොන්සේකා මහතා පවසන අන්දමට "ඔබට ආර්ථිකයත් ගොඩ නැඟීමට සිදු වන්නේ ආරක්ෂාවත් සහිතව ය." බිලියන 6 ක ජනතාවක් සිටින ලෝකයක වනය වැට ගසා වෙන් කර මිනිසාගේ ජීවිතයෙන් සිදුවන බලපෑම නොසලකා හැරිය නොහැකි ය.

වනය සමග සිට එය ආක්‍රමණය නොකොට දියුණු වීමේ හැකියාව අත්‍යවශ්‍ය ය.

"සංරක්ෂණය" යන්නෙහි අනාගතය එක් වචනයකින් විස්තර කළ හැකිය යනුවෙන් ලෝක වන ජීවී අරමුදලේ (එක්සත් ජනපද) ප්‍රධාන විද්‍යාඥයෙක් වන එරික් ඩිනර්ස්ටීන් පවසයි. එනම් කළාපකරණය යි.


"අපට සංවර්ධනය නතර කළ නොහැකි ය. අප එය කළ යුතු ද නොවේ. අපට කළ හැකි දෙය වන්නේ අවම හානියක් වන තැන එය ඇති කිරීම යි."

කාඩමම් කඳුවැටියේ වැඩි ම හානිය සිදු කර ඇත්තේ දඩයක්කරුවන් විසිනි. කාම්බෝජියානු රජය සමග ඇති කර ගත් ගිවිසුමක් යටතේ ජාත්‍යන්තර සංරක්ෂණ ආයතනය විසින් අනවසර කොටකැපීම් හා දඩයම් කිරීම නැවැත්වීම පරීක්ෂා කිරීමට 125 දෙනෙකුට ගෙවීම් සිදු කරයි. මෙම කණ්ඩායම ආදායම් අහිමි වුවත් සඳහා කෘෂිකාර්මික හා සෞඛ්‍ය ව්‍යාපෘතිය පවත්වාගන යයි. අනවසර වන ක්‍රියාකාරකම් වලින් ජීවත් වූ මිනිසුනට ගොවිතැනින් ලැබෙන්නේ අඩු මුදලකි. ඔවුහු එයට අකමැති බව කාම්බෝජියාවේ මෙම වැඩසටහන මෙහෙවන ඩේවිඩ් ඊඩ් පවසයි. එසේම ගොවීන්ට හරක් ආදී සතුන් සපයා දීම මගින් වනය ආශ්‍රිත හේන් වැවීමෙන් මිදී කුඹුරු සකස් කර ගැනීමට ඉඩ ප්‍රස්ථා ඇති කර දීම ද එක් සැලැස්මක අන්තර්ගත ය.

මෙම සංරක්ෂිත ප්‍රදේශය සඳහා මූල්‍යමය පහසුකම් ලබා ගැනීමට ජාත්‍යන්තර සංරක්ෂණ ආයතනය විසින් බාහිර අරමුදලක් පිහිටුවා ඇත. එය පිහිටුවා ඇත්තේ සංරක්ෂිත ප්‍රදේශය පාලනය කිරීමට වාර්ෂිකව ලැබෙන මුදලිනි. මෙම දිගුකාලීන පොරොන්දුව සඳහා හුවමාරුවක් වශයෙන් රජය පසුගිය මාසයේ දැව කැපීම තහනම් ප්‍රදේශයක් බවට පත් කරමින් හෙක්ටයාර මිලියන බාගයක් පමණ ප්‍රකාශයට පත් කළ අතර එසේ කරන ලද්දේ විදේශීය දැව ආයතනවලට දී තිබූ පොරොන්දු හයක් කඩ කරමිනි.

මෙවන් උත්සාහයන් ක්‍රියාත්මක වන බව පෙනෙනුයේ නිරන්තර පෙළඹවීම් සහ සොයා බැලීම් ඇතිවිට පමණක් බව පවසන පරිසර හිතකාමී කණ්ඩායම් එසේ නොමැති වූ විට අරමුදල් වෙනත් ව්‍යාපෘති වලට යෙදවීම හෝ දූෂිත නිලධාරීන් විසින් සොරකම් කිරීම සිදුවන බව පවසති. වන ප්‍රදේශයක් ආරක්ෂා කිරීමේ සාර්ථකත්වය සහ අසාර්ථකත්වයත් අතර වෙනස පැහැදිලි බව නිව්යෝර්ක් නුවර බ්‍රොනොක්ස් සත්ව උද්‍යනයේ වනජීවී සංරක්ෂන සමාජයේ විද්‍යා හා ගවේෂණ අංශයේ අධ්‍යක්ෂ ඇලන් රැබිනෝවිට්ස් පවසයි. අසාර්ථකත්වය යනු ව්‍යාපෘතියක් පිහිටුවා ඉන් ඉවත්ව ගිය අවස්ථා ය.

වනය ආරක්ෂා කළ යුතු හොඳ ම ආකාරය කුමක් ද? සෑම රාජ්‍යයක් ම ඒවාට ආවේණික ලක්ෂණ වලින් සමන්විත ය. මේ නිසා සෑම උපාය මාර්ගයක් ම දේශීය තත්ත්වයන්ට ගැලපිය යුතු ය යනුවෙන් බර්මා හි ජාතික උද්‍යානයක් සහ බෙලයිස් හි ජගුවාර් රක්ෂිතයක් ඉදි කිරීමට උදව් කළ රේබිනෝවිට්ස් පවසයි. උතුරු බර්මා හි හ්කාකාබෝරාසි ජාතික උද්‍යානයේ ස්වදේශීය



කිමිදුම්කරුවන්ගේ පාරාදීසය නෙදර්ලන්තයේ ඇන්ටිල්ස් හි රූ දෙස් සංචරණය මගින් ලැබෙන ආදායම සහාමැරීන් උද්‍යානය නඩත්තු කිරීමට උපකාර වේ.

**බිලියන 6 ක ජනතාවක් සිටින ලෝකයක වනය වැට ගසා වෙන් කර මිනිසාගේ ජීවිතයෙන් සිදුවන බලපෑම නොසලකා හැරිය නොහැකි ය. වනය සමග සිට එය ආක්‍රමණය නොකොට දියුණු වීමේ හැකියාව අත්‍යවශ්‍ය ය.**

මිනිසුන් විසින් රතු පැන්ඩාවන් හා කොළ මුවන් දඩයම් කරනු ලබන බවත් එය ආහාර සඳහා අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා ඉතා ම වැඩි ප්‍රමාණයක් බවත් රේබිනෝවිට්ස් සොයාගත ඇත. මිනිස්සු සත්ත්ව හම් චීන වෙළෙඳුන් සමග හුවමාරු කරති. එසේ කරනුයේ එම ප්‍රදේශවල ස්වභාවිකව නොලැබෙන ලුණු ලබාගැනීම සඳහා ය. එයට පිළිතුරු වශයෙන් ලුණු බෙදා හැරීමේ වැඩ සටහනක් රේබිනේවිට්ස් විසින් ආරම්භ කළේ ය. වසරකට ඩොලර් 500 කට වඩා අඩු වියදමකින් එහි සිටින 3000 පමණ වූ ජනගහණයට අවශ්‍ය තරමට ලුණු ලබාදීම සිදු වේ. මේ නිසා අනවශ්‍ය ගනුදෙනුවක් සඳහා සතුන් දඩයම් කිරීමට අවශ්‍යතාවක් නොමැත.

**පහත සඳහන් වන්නේ ලෝකය පුරා පවතින වනගහණය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති අපේක්ෂා තැබිය හැකි උපාය මාර්ග කිහිපයකි.**


## ස්වභාවිකත්වයට ණය හුවමාරු වෙයි

ආරක්ෂා වී පවතින වනාන්තර හිමි බොහෝ රටවල් සාපේක්ෂ වශයෙන් දුප්පත් හා සංවර්ධිත රටවලට ණය වී සිටින තත්ත්වයක් පවතියි. තෝමස් ලවජෝයි ලෝක වනජීවී අරමුදල සමග විෂම තත්ත්වයන් යහපත් තත්ත්වයන්. බවට පත් කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල් ඒවායේ වනගත පදේශවලට ආරක්ෂිත තත්ත්වයක් ලබා දීමේ පදනම මත ණය ලබා දීම හෝ නිදහස් කිරීම සම්බන්ධ අදහසක් දරයි. මෙම ස්වභාවධර්මය සඳහා ණය හුවමාරු කිරීමේ ප්‍රථම අදියර සංරක්ෂණ ජාත්‍යන්තරය විසින් 1987 වසරේ බොලිවියාවේ බෙනි බයොස්ෆියර් රක්ෂිතය සම්බන්ධව ආරම්භ කෙරිණ. එක්සත් ජනපදයේ කොන්ග්‍රස් මණ්ඩලය මෙම උපාය මාර්ගයන්ට 1998 වසරේ ඝර්මකලාපීය වැසි වනාන්තර පනත මගින් ප්‍රසිද්ධියක් ලබා දෙමින් වන සංරක්ෂණය වෙනුවෙන් යම් යම් රටවල ණය අඩු කිරීමේ බලය ජනාධිපතිට පවරන ලදී. රජය හෝ පෞද්ගලික අංශය රටවල් 30 කට වැඩි ප්‍රමාණයක් සමග මෙම හුවමාරුව සිදු කර ඇත.

එක්සත් රාජධානිය ජූනි මාසයේ දී පරිසර හිතකාමී කණ්ඩායම් 3 සමග වැඩ කරමින් පීරු රාජ්‍යයේ ඩොලර් මිලියන 5.5 වූ විදේශ ණය අවලංගු කළේ ය. එයට හුවමාරුවක් වශයෙන් පීරු රාජ්‍ය හෙක්ටයාර මිලියන 11 වූ ඝර්ම කලාපීය වැසි වනාන්තර එහි සිටින සතුන් වන ඩොල්පින්, ජගුවරයන් හා රතු පැහැ මැකෝ කුරුල්ලන් හා යෝධ දිය ලිලී මල් වැනි විවිධ වූ සතුන් හා ශාඛ සමග ආරක්ෂා කළ යුතු ය. රාජ්‍ය නොවන සංවිධාන මෙම ආරක්ෂිත කලාපයන් හි රෙගුලාසි නියමාකාර ලෙස ස්ථාපිත වී ඇති දැයි අධීක්ෂණය කිරීම සිදු කරයි. එය ඉතා යහපත් වූ රාජ්‍ය හා පෞද්ගලික සහයෝගිතා ව්‍යාපෘතියකි. මේ සම්බන්ධ පූර්ව නීති උපදේශක ලෙස කටයුතු කළ වොෂින්ටනයේ හෙවිත්ටන් හා බර්ලින් හි ඇටෝනිවරයකු වූ ස්ටුවර්ට් අර්වින් මහතා පවසයි.

## කාබන්වලට එරෙහි වාතය

ලෝකය උණුසුම් වීමට එරෙහිව පිහිටු වූ කියෝතෝ සමුළුව අනුව බටහිර යුරෝපය හා ජපානය ඔවුන්ගේ කාබන්ඩයොක්සයිඩ් මුදා හැරීම 1990 මට්ටමට ගෙන ආ යුතු ය. (එක්සත් ජනපදය මෙම සමුළුවට සහභාගි වීම ප්‍රතික්ෂේප කරන ලදී.) අරමුණ කරා ළං වීමට ඇති එක ක්‍රමයක් නම් වඩා දුප්පත් රටවල් ඔවුන්ගේ භූමිය කැලෑව වශයෙන් කාබන්ඩයොක්සයිඩ් උරා ගැනීමට ආරක්ෂා කර තැබීම සඳහා ගෙවීම යි. උදාහරණයක් ලෙස වැසි වනාන්තර විනාශ නොකිරීම සම්බන්ධව ජපානය පීරු රාජ්‍යයට ගෙවීම් කළ හැකි ය. මෙම ක්‍රියාවලියේදී කාබන් උරා ගන්නා ප්‍රමාණය ජපානයේ කාබන් නිකුත් කිරීමේ ශේෂ පත්‍රය හර පැත්තේ සටහන් විය යුතු ය. "මෙම තත්ත්වය මානව ඉතිහාසයේ නව ප්‍රවණතා ආපසු හැරවීමක් කරයි" යනුවෙන් අර්වින් පවසයි. එක්වරම ගස් සහිත භූමිය ගස් රහිත භූමියට වඩා වටිනාකමක් පෙන්වයි.



**බලාගෙනයි පරිස්සමෙන් මෙම මියන්මාර් උද්‍යානයේ මිනිසුන් රතු පැන්ඩා හා කොළ මුවන් දඩයම් කරන වැලැක්වීම සඳහා රැයිනෝ පිට්ස්ලුණු ලබා දීම සිදු කළේ ය.**

## සංරක්ෂිත සහාය දීමනා

සංරක්ෂිත කණ්ඩායම් තර්ජනාත්මක ප්‍රදේශවලින් දැව සහාය දීමනා බද්දට හෝ මිලට ලබා ගෙන එය ගස් කැපීමේ සීමාවෙන් ඉවත් කර තබා ගනී. මේවා පුදුම සහගත ලෙස ලබා ගත හැකි මට්ටමක පවතින්නේ හුදකලා ප්‍රදේශවල කපන ලද දැව සම්බන්ධ ආදායම් රේඛාව ඉතා අඩු ප්‍රමාණයක් වූ මිලදී ගන්නන් නිසා පහත මට්ටමක පැවතීම යි. නේචර් කොන්සර්වෙන්සි ආයතනය 1998 දී බොල්වියාවේ නොයෙල් කෙම්ප්ෆ් මර්කාඩෝ ජාතික උද්‍යානය සම්බන්ධ කර හෙක්ටයාර් මිලියන 1.6 එකජ් ඩොලර් දෙක බැගින් මිල දී ගෙන උද්‍යානයේ ප්‍රමාණය දෙගුණ කරන ලදී. 2000 වසරේදී සංරක්ෂිත ජාත්‍යන්තර හෙක්ටයාර් 81000 ක වූ නැගෙනහිර ප්‍රදේශයේ වන භූමි ප්‍රමාණයක් ඩොලර් 20 000 ක මූලික ගෙවීමකට හා වාර්ෂික ගෙවීමකට යටත්ව බදු දෙන ලදී. මේ නිසා ගස් කපන්නන් මුදලින් පාලනය කළ නොහැකි අවස්ථාවක වුව ද ඔවුන් කරන හානිය අවම කළ හැකි ය. කොංගෝවේ හි වනජීවී සංරක්ෂණ සමාගම සී.අයි.බී. නැමති ජර්මන් සමාගමට එහි සේවකයන්ට ආහාර සඳහා දඩමස් වෙනුවට කුකුල් හා හරක්මස් දීමට බලපෑම් කර ඇත. එයට හේතුව ඔවුන් දඩමස් ලබා ගනුයේ නොආබල් න්ඩෝකි ජාතික උද්‍යානයේ ගස් කැපීමට අවසර දී ඇති කොටසේ වීමයි.

## රූ දෙස් සංචරණය

පරිසරවේදීන්ට "රූ දෙස් සංචරණය යනු දෙපැත්ත කැපෙන කඩුවකි. එමගින් වනගහනයන් හි අවශ්‍යතා පිළිබඳ මිනිසා දැනුවත් කිරීම කළ හැකි අතර කිසිදු දිනෙක මිනිසාට ළඟා විය නොහැකි හුදෙකලා වූ පරිසර පද්ධති මිනිසාට හඳුන්වා දිය හැකි ය. එහෙත් සමහර ව්‍යාපාර සංචාරකයන්ගෙන් ලැබෙන ආදායම් යම් යම් ප්‍රදේශ

නොකිලිටි ලෙස තබා ගැනීම සඳහා භාවිතා කරමින් අඩු බලපෑමක් ඇති කරමින් සංචාරයන් සඳහා යොමු වී ඇත. බෙලයිස් හි ලාභ නුපදවන කණ්ඩායමක් බෙලයිස් හි වයඹ ප්‍රදේශයේ හෙක්ටයාර් 105 000 වන ප්‍රදේශයක් (එය රටේ මුළු භූමි ප්‍රමාණයෙන් 4% ක් පමණ වේ) මිලදී ගෙන ඇත. එය ගස් කැපීම සඳහා ඊට පෙර වෙන් කර තිබුණු ප්‍රදේශයකි. එහෙත් මෙම ප්‍රදේශයෙන් අඩක් පමණ දැන් සංරක්ෂිත ප්‍රදේශයකි. එය වන සංවර්ධනය හා සංචාරක ව්‍යාපාරය සඳහා අනුමැතිය දී ඇති අන්තර් කලාපයකින් වට වී ඇත. රු දෙස් සංචරණය මගින් රක්ෂිතයේ කළමනාකරණ වියදමින් 60% පමණ ආවරණය වේ. නෙදර්ලන්තයේ ඇන්ටිලීස් හි සභාමැරීන් උද්‍යානයේ හා නේපාලයේ චිට්වාන් ජාතික උද්‍යානයේ මෙයට සමාන වැඩසටහන් දක්නට ලැබේ.



සැරිසැරීමට ඉඩ නැතිව මෙම කොටින්ගේ ආරක්ෂාව රැඳී පවතින්නේ ඉන්දියාව හා නේපාලය අතර වෙරායි සැලසුම් ක්‍රියාත්මක වීම මත ය.

## සාගර සංරක්ෂණය

සාගර තුළ පවතින වනගහනයන් සාපේක්ෂ වශයෙන් නව සංකල්පයකි. මෙහි පුරෝගාමියෙක් ලෙස බිල් බැලන්ටයින් හැඳින්විය හැකි ය. ඔහු නවසීලන්තයේ සාගර විද්‍යාඥයෙක් වන අතර ඕක්ලන්ඩ් විශ්ව විද්‍යාලය සමග 1965 වසරේ දී සියලු ආකාරයේ මාළු ඇල්ලීම් තහනම් කිරීමේ සංරක්ෂිතයක් ආරම්භ කිරීමේ අදහස ඉදිරිපත් කළේ ය. නවසීලන්තයේ දැනට සාගර සංරක්ෂිතයන් 16 ක් ඇති අතර අනිකුත් ඒවා ඕස්ට්‍රේලියාවේ බෙලයිස්, ගැලපගස් දූපත් හා කැරිබියන් දූපත්වල ස්ථාපිත කර ඇත. නේචර් කොන්සර්වෙන්සි ආයතනය 2000 වසරේදී පැල්මයිරා නම් වූ කුඩා දූපත එහි ඇති හෙක්ටයාර් 6000 වූ නොසිඳුල් කොරල්පර ආරක්ෂා කිරීමේ පරමාර්ථයෙන් මිලදී ගත්තා ලදී. එම දූපත පිහිටා ඇත්තේ හවායි දූපත්වල සිට 1600 ක් පමණ දුරිනි.

> බොහෝ අවස්ථාවල මෙවන් සත්ත්ව වර්ගවලට ඔවුන්ගේ ජනගහනය ව්‍යාප්ත කර ගැනීමට අවශ්‍ය ඉඩකඩ සොයා ගැනීම වර්තමානයේ අපහසු වී ඇත. මේ නිසා විද්‍යාඥයෝ යාබදව පවතින රක්ෂිතයන් සම්බන්ධ කරමින් වන මාර්ග සෑදීම පිළිබඳව සලකා බලමින් සිටිති.

## වනගහන සබඳතා කලාප

සමහර විශාල සතුන්ට ජීවත් වීම හා වර්ගයා බෝ කිරීම සඳහා විශාල ප්‍රදේශ අවශ්‍ය වේ. උදාහරණයක් වශයෙන් සයිබීරියානු පිරිමි කොටියාට වර්ග කිලෝමීටර් 1000 ක් දක්වා ව්‍යාප්ත වූ නිවාස සීමාවක් සතු ය. බොහෝ අවස්ථාවල මෙවන් සත්ත්ව වර්ගවලට ඔවුන්ගේ ජනගහනය ව්‍යාප්ත කර ගැනීමට අවශ්‍ය ඉඩකඩ සොයා ගැනීම වර්තමානයේ අපහසු වී ඇත. මේ නිසා විද්‍යාඥයෝ යාබදව පවතින රක්ෂිතයන් සම්බන්ධ කරමින් වන මාර්ග සෑදීම පිළිබඳව සලකා බලමින් සිටිති. මෙහි යෝජනාවක් යටතේ කැනඩාවේ යුකෝන් සිට යෝමියන්ග් හි යෙලෝස්ටෝන් ජාතික උද්‍යානය එකට සම්බන්ධ කර වලසුන්ට වඩා විශාල ප්‍රදේශයක සැරි සැරීමට ඉඩ ලබාදීම අපේක්ෂිත ය. ලෝක වනගහන අරමුදලේ සැලසුමකට අනුව උතුරු ඉන්දියාව හා නේපාලය හරහා එවැනි ම සංවර්ධන සැලසුමක් සකස් කර ඇත. මෙමගින් ජාතික උද්‍යාන 11 ක් හා රක්ෂිතයන් වර්ග කිලෝමීටර් 70 000 ක ප්‍රදේශයක් දක්වා ඒකාබද්ධ වීම මගින් කොටි හා අනිකුත් විශාල සතුන්ට විශාල යහපතක් වනු ඇත.

## පරාර්ථකාමිත්වය

1990 වසරවල දී ඉහළ ගිය කොටස් වෙළෙඳපොළ හා ඒ සමග ම බිහි වූ කෝටිපතියන් නිසා වනගත ප්‍රදේශ පෞද්ගලිකව අත්පත් කර ගැනීමේ කාර්යයන් තාවකාලික හෝ ඉහළ යාමක් සිදු විය. ඉතාමත් චමත්කාරජනක ගනුදෙනුවක් ලෙස නෝර්ත්ෆේස් හා එස්පිරිම් රෙදි කම්හල් අයිතිකරු වූ ඩෝ ටොම්ප් කින්ස් විසින් දකුණු චිලී හි සෞම්‍ය කලාපීය වැසි වනාන්තර හෙක්ටයාර් 300 000 ක් මිලදී ගැනීම දැක්විය හැකි ය. පියුමාලින් උද්‍යානය මිලදී ගැනීමට ටොම්ප් ඩකින්ට ඩොලර් මිලියන 15 ක් පමණ වැය විය. ඒ චිලී මුහුදු තීරයේ සිට ආර්ජන්ටිනාව දක්වා පැතිරී ඇත. දැන් ඔහු දකුණු ආර්ජන්ටිනාවේ පැටගෝනියා මුහුදු තීරයේ රක්ෂිතයක් ඇති කිරීම සඳහා භූමිය මිල දී ගනිමින් සිටී. අනිකුත් පෞද්ගලික ගැනුම්කරුවන් වූ නිව්යෝර්ක් නුවර පීඩන් පදනමේ ඇලන් එඩන් හා සැන්ප්‍රැන්සිස්කෝ හි නීතිඥවරයකු හා එස්පිරිට් යුරෝපයේ ප්‍රධානියා වූ පීටර් බෙක්ලි පිළිවෙලින් දකුණු ඇමරිකාවේ හා අප්‍රිකාවේ හෙක්ටයාර් 80 000 ක් හා ලතින් ඇමරිකාවේ වැසි වනාන්තර මිල දී ගත්හ.

## ස්වදේශීය පාලනය

ස්වදේශිකයන් තුළ තම පාරම්පරික භූමියට ඇති ලැදියාව පදනම් කර ගනිමින් ද වනගහන ආරක්ෂා කිරීමේ හැකියාවක් ඇත. රුසියානු සයිබීරියාවේ යාකුටියා රාජ්‍යයේ වර්ග කිලෝමීටර් 700 000 ක් පමණ වූ ප්‍රදේශ සාම්ප්‍රදායික දඩමස් හා මාළු ඇල්ලීමට හැර අනෙකුත් කර්මාන්තවලට තහනම් ප්‍රදේශයක් බවට පත් කර ඇත. ඉක්වදෝරයේ ආවා ජන කොටස ද 1985 දී ඔවුනට හිමි වූ චොකෝ වනාන්තරයේ හෙක්ටයාර් 120 000 න් අවුරුදු 10 කට පසු හෙක්ටයාර් 17 000 ක් ජනාවාස බවට පත් නොකරන රක්ෂිතයක් බවට පත් කිරීමට ලෝක ජනගහන අරමුදල සමග ගස් කපන්නන්ගේ එරෙහිවීම් මධ්‍යයේ වුවද ගිවිසුමකට අත්සන් තබා ඇත.

සංරක්ෂිත ජාත්‍යන්තර ආයතනය මගින් කරන ලද සමීක්ෂණයක් අනුව වන ගහන 37 ක 70% ක් පමණ මුල් වෘක්ෂලතා ආදිය තවම ඒ ආකාරයෙන් පවතින බවත් ඒවා ප්‍රමාණයෙන් වර්ග කිලෝමීටර් 10 000 ක් වන අතර එහි වර්ග කිලෝමීටරයකට සිටින ජනගහනය 5 ක් පමණ වන බවත් සොයා ගෙන ඇත.

මෙම අවසාන වන ප්‍රදේශයන් පෘථිවියේ භූමි ප්‍රමාණයෙන් 46% ක් පමණ වේ. අප සතුව පවතින සියලු ම සම්පත් හා උපායමාර්ග සහිතව මෙම භූමි ප්‍රමාණයක් වැඩි ප්‍රමාණයක් ආරක්ෂා කර ගැනීමට හැකියාව අප සතුව පවතී. ❑

**TIMES** ඇසුරිනි

**චමිලා නිස්සංග**